සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

නම/විභාග අංකයඃ-.............................. **චිත්‍ර කලාව - I, II** කාලයඃ-පැය 02යි

1 **ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

1 **පහත දී ඇති රූප සටහන ඇසුරින් අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**




01. ඉහත රූප සටහනෙන් දැක්වෙන්නේ ........................................................................ කෝවිලක ඉදිරිපස ගෘහ නිර්මාණාත්මක අංග වේ.

02. මෙම ගොඩනැගිල්ලෙහි බිම් සැලැස්ම ප්‍රධාන කොටස් .................................................... කින් සමන්විතය.

03. මෙහි A අක්ෂරයෙන් දැක්වෙන්නේ ............................................................. නම් ප්‍රධාන ගෘහ නිර්මාණ අංගයයි.

04. B අක්ෂරයෙන් දැක්වෙන්නේ ........................................................... කුලුණුය.

05. මෙම ගොඩනැගිල්ලේ ගෘහ නිර්මාණ කලාව කෙරෙහි බලපා ඇත්තේ ........................................... ඉන්දීය ගෘහ නිර්මාණ කලාවයි.

1 **ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

06. තෛපොංගල් උත්සවය සමරනු ලබන්නේ
(i) බෞද්ධ ආගමිකයන්ය. (ii) හින්දු ආගමිකයන්ය.
(iii) මුස්ලිම් ආගමිකයන්ය. (iv) ක්‍රිස්තියානි ආගමිකයන්ය.

07. මූර්තියක් ඇඹීම සඳහා භාවිත කළහැකි පහසුම මාධ්‍ය වන්නේ,
(i) සිමෙන්ති (ii) ලෝකඩ (iii) මැටි (iv) කළුගල්

08. රාමසාන් උත්සව දිනයට පෙර මුස්ලිම් භක්තිකයන් උපවාසයක යෙදෙයි. එම උපවාසය හඳුන්වන නම,
(i) 'සවම්' නමිනි. (ii) 'රාමලාන්' නමිනි. (iii) 'සදකා' නමිනි (iv) 'සලාත්' නමිනි

09. වෙල් කඳුරු ගෙඩි හා නාවා ගස්වල ගෙඩි පහන් සඳහා භාවිතා කරනු ලබන්නේ,

(i) නත්තල් උත්සවයෙහිදීය (ii) තෛපොංගල් උත්සවයෙහිදීය

(iii) රාමසාන් උත්සවයෙහිදීය. (iv) වෙසක් උත්සවයෙහිදීය.

10. චෛත්‍ය ගර්භයෙහි හැඩය අනුව, නම් කරන ලද ප්‍රධාන චෛත්‍ය වර්ග සංඛ්‍යාව,

(i) හයකි (ii) හතරකි (iii) පහකි (iv) තුනකි

1 **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා A තීරුවට ගැළපෙන නිවැරදිම වචනය B තීරුවෙන් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | වෙසක් උත්සවය | නිල්, කහ, රතු |
| 12. | ජ්‍යාමිතික හැඩ | දිය බුබුලක හැඩය |
| 13. | මූලික වර්ණ | බෞද්ධාගමිකයන් |
| 14. | රූපාක්ෂර | සමචතුරස්‍ර, ත්‍රිකෝණ |
| 15. | බුබ්බුලාකාර | මුස්ලිම් පල්ලිය |

1 **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වාක්‍ය හරිනම් (4) ලකුණ ද වැරදි නම් (5) ලකුණ ද වාක්‍ය ඉදිරියේ ඇති හිස්තැනෙහි යොදන්න.**

16. උල් වූ තුඩක් සහිත ගෝලාකාර ශිඛරය චෛත්‍යයක අංගයකි. (...............)

17. ශ්‍රී ලංකාවේ චෛත්‍යය වල හතරැස් කොටුව යන අංගය, ඉන්දියාවේ සාංචි ස්ථූපයටද යොදා ඇත. එය හඳුන්වන්නේ හර්මිකාව යනුවෙනි. (...............)

18. කෝලම් රටාව මැද පූර්ණ කුම්භ සාදා පහනක් තබා කිරිබත් පිළියෙළ කරන්නේ සිංහල අළුත් අවුරුද්දටයි. (...............)

19. දම් පාට ද්විතියික වර්ණයකි. (...............)

20. වර්ණවත් කඩදාසි ඉරා ඇලවීමෙන් කොලාජ් චිත්‍රයක් නිර්මාණය කළ හැකිය. (...............)

(ලකුණු 2 x 20 = 40 )

## II කොටස

පහත සඳහන් මාතෘකාවලින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.

1. සමනලයකුගේ හැඩයක් යොදා ගනිමින් ව්‍යාප්ත මෝස්තරයක් අඳින්න.
2. මූලික වර්ණ තුන හා එක් ද්විතියික වර්ණයක් පමණක් භාවිතා කරමින් තෑගි දවටනයකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
3. ''ගිරා යාළුවෝ'' නමැති කතන්දර පොතට පිට කවරයක් අඳින්න.
4. වෙසක් පෝයට පෙර ගමේ පන්සලේ ශ්‍රමදානය
5. අම්මා මල්ලීට කෑම කවනවා
6. සවස් කාලයේ ගමේ කඩේ ළඟ (ලකුණු 60)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

### චිත්‍ර කලාව පිළිතුරු පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | හින්දු | 2. | හතර (4) | 3. | ගෝපුර | 4. | පැන්නුම් |
| 5. | දකුණු | 6. | (ii) | 7. | (iii) | 8. | (i) |
| 9. | (iv) | 10. | (i) | 11. | බෞද්ධාගමිකයන් | 12. | සමචතුරස්‍ර හා ත්‍රිකෝණ |
| 13. | නිල්, කහ, රතු | 14. | මුස්ලිම් පල්ලිය | 15. | දිය බුබුලක හැඩය | 16. | 5 |
| 17. | 4 | 18. | 5 | 19. | 4 | 20. | 4 |

එක් නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 40කි.

චිත්‍ර කලාව II

සිසුන් විසින් අඳින ලද මෝස්තර හෝ ප්‍රකාශන චිත්‍රය සඳහා ලකුණු 60කි.

මුළු ලකුණු 100කි.